, පිළියන්දල අධ්‍යාපන කලාපය
Piliyandala Educational Zone

10 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය - 2017
Grade 10 - Second Term Test – 2017

| සිංහල භාෂාව හා සාහිත්‍යය I | Sinhala Language & Literature I | කාලය පැය 01 |
|---|---|---|

සැලකිය යුතුයි :

(i) **සියලු ම** ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) උත්තරවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ **උත්තරය** තෝරන්න.

(iii)**ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්,ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X), **ලකුණ යොදන්න.**

(vi)එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01.කොළඹ කසළ කරදියානට දැමීම නිසා ප්‍රදේශවාසීන්ගේ **උණුසුම් තත්වයක්** ඇති විය.
(1)උපකල්පනයක් (2)උද්ධමනයක් (3)උද්ඝෝෂණයක් (4)උවමනාවක්

02.පරිසරය සුරැකීම **කොළේ වහලා ගැහීමෙන්** කළ නො හැකිය.
(1)ඇත්ත කීමෙන් (2)ඇත්ත වසන් කිරීමෙන් (3)කොළ හැංගීමෙන් (4)විවාද කිරීමෙන්

03.අවතැන්වූවන්ට නිවාස ලබාදීමේදී **මූණ බලා කටයුතු කිරීම** නිසා ජනතාව අසරණ වූහ.
(1)අල්ලසට උනන්දු වීම (2) මුහුණට මුහුණ වැඩ කිරීම (3) පක්ෂග්‍රාහී වීම (4)හැඳුනුම්කම් නො සැලකීම

04.ලොක්කන්ට **කත් ඇදීමෙන්** ඔහු තම වැඩ කර ගනියි.
(1) අනිසි වැඩ පල කර දීමෙන් (2) අල්ලස් ලබා දීමෙන්
(3) බැණ වැදීමෙන් (4) උද්ඝෝෂණ කිරීමෙන්

☆ අංක **5** සිට **7** තෙක් ඇති ප්‍රශ්නවල 'හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

05.පහළ ම පේසාවෙහි සෑය වටේ´ම නියමිත පරතරයකට අනුව ............................ සලකුණු විය.
(1) පාද පීඨිකා (2) පාද අංගුලිකා (3) කුච්ඡ වේදිකා (4) චෛතියඝර

06. ............................ සමාජයන්හි නව දැනුම ලබා ගැනීම සඳහා විවිධ බාධක පැවතිනි.
(1) සාම්ප්‍රදායික (2) නවීන (3) ප්‍රවේණි (4) ජනවාර්ගික

07.ටී.බී. ජායා මහතා මුස්ලිම් ජනතාවගේ සමාජීය හා දේශපාලනික කටයුතුවල මෙහෙයුම්කරුවකු හා ............................ ලෙස වැදගත් සේවයක් ඉටු කළේ ය.
(1) වෛද්‍යවරයෙකු (2) මාර්ගෝපදේශකයෙකු (3) අන්තවාදියකු (4) ආගම්වාදියෙකු

08. අක්ෂර වින්‍යාසය **වැරදි ව** යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1)ඉහත ලක්ෂණ දෙකට අමතර ව කාව්‍ය නිර්මාණයෙහි දී තිබිය යුතු ඊළඟ ලක්ෂණය වනුයේ සතතාභ්‍යාසයයි.

(2)මුල් ප්‍රවෘත්තිය දන්නා පාඨකයාට ඒ සම්බන්ධ ප්‍රකාශ, සංඛ්‍යා, දත්ත, ආදිය මාර්ගයෙන් හා විවිධ කෝණ ඔස්සේ ගැඹුරු අවබෝධයක් ලැබේ.

(3)සාහිත්‍ය නිර්මාණයක දී වාච්‍යාර්ථය ඉක්මවා ව්‍යංගාර්ථය ජනනය කරන ආකාරයට කවියා බස හසුරුවයි.

(4)ලෝකයේ හැම ජන කොට්ඨාසයකට ම තම රටට ආදරය, පක්ෂපාතභාවය, දේශානුරාගය දනවන නිර්මාණ ඇත.

09. **සින්ධූපමාන** වැව් තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදය
(1)රූපකයකි (2)උපමාවකි (3)අනුප්‍රාසයකි (4)උපමානයකි

10. මූණ රවාගෙන ගොස් ගෙට වැදිලා
පූන නූල ඇද **දමමින්** බිම පෙරළා
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදය
(1)පූර්ව ක්‍රියාවකි(2)විධි ක්‍රියාවකි(3)මිශ්‍ර ක්‍රියාවකි (4)අසම්භාව්‍ය ක්‍රියාවකි

11. පහත සඳහන් පාඩම්වල නම් **අකාරාදී පිළිවෙළට** සකස් කර ඇති නිවැරදි පිළිතුර තෝරන්න.
(1)සිංහල අක්ෂර මාලාව/තොරොක්කෝව/මං තනන්නෝ/බසින් රස මවන සාහිත්‍යය
(2) බසින් රස මවන සාහිත්‍යය/ මං තනන්නෝ/ සිංහල අක්ෂර මාලාව/ තොරොක්කෝව
(3) මං තනන්නෝ/සිංහල අක්ෂර මාලාව/ තොරොක්කෝව/ බසින් රස මවන සාහිත්‍යය
(4) තොරොක්කෝව/ බසින් රස මවන සාහිත්‍යය/ මං තනන්නෝ/ සිංහල අක්ෂර මාලාව

අංක **12** සහ **13** ප්‍රශ්නවල මුලින් දී ඇති තනි පදයට උචිත යෙදුම් තෝරන්න.

12. **ආකස්මිකව**
(1)හේතු පාදක කරගෙන (2) හේතුවක් ඇති ව (3) හේතුවක් නැතිව (4) අත්දැකීම් නැතිව

13. **සබවස**
(1)සබකෝලයෙන් යුක්ත(2)සභාවක සිටින (3) සත්‍ය වූ වචන(4)සභාවේ අසුන් ගන්නා

14.පහත සඳහන් පද්‍ය පාඨ නිර්මාණය කළ **රචකයන්ගේ නම් පිළිවෙලින් නිවැරදිව සඳහන් වරණය** තෝරන්න

**"ගංගා තරංග රාව දී රිදී වණින්"**
**"හාල් තුනපහේ අරගෙන කන්නට ද"**
**"පිරුවානා පොත් වහන්සේ"**
**"චන්දෝ බිළින්දෝ නාඩා නැළවෙන්න"**

(1)මහගමසේකර මහතා/රත්න ශ්‍රී විජේසිංහ මහතා/විමල් දිසානායක මහතා/ගුණදාස අමරසේකර මහතා

(2)මහගමසේකර මහතා/ගුණදාස අමරසේකර මහතා/ විමල් දිසානායක මහතා/ රත්න ශ්‍රී විජේසිංහ මහතා

(3)මහගමසේකර මහතා/ විමල් දිසානායක මහතා/ රත්න ශ්‍රී විජේසිංහ මහතා/ගුණදාස අමරසේකර මහතා

(4)මහගමසේකර මහතා/ විමල් දිසානායක මහතා/ගුණදාස අමරසේකර මහතා/රත්න ශ්‍රී විජේසිංහ මහතා

අංක **15** සිට **17** තෙක් ඇති ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න

15. රචකයා තම **පරිකල්පනය** මෙහෙයවා තමා ලත් අත්දැකීම ප්‍රතිනිර්මාණය කරයි.
(1)අනුමාන සිතිවිල්ල(2)නැවත ගොඩනැංවීම(3)අපූර්ව වස්තු නිර්මාණය(4)අළුත් නිර්මාණ

16. බඩ වක පිට වක සත් **වැරටිල්ලා**
දෙපටට කුඩු ගැසි වකට කුදිල්ලා
(1)වැරැටි(2)කුරුමිණියා(3)ගොම කැබලි(4)වැරදිකාරයා

17. එකල් හි අනඳ මහතෙරහු බුදුන් කෙරෙ බලවත් සෙනෙහයෙන් **අධිවාසනා** නො කටැහී,"මෙ ඇත් පළමු මා මරව" යි.
(1) පෙරවාසනාව(2) ඉවසීමේ ගුණය(3) අධිෂ්ඨානය(4) නිර්භයව

18. **යුගල පදයක් නොවන පදයක්** සහිත වරණය තෝරන්න.
(1)ඉඩම් කඩම්,ගමන් බිමන්,ගනු දෙනු
(2)ඉඳුම් හිටුම්,අවි ආයුධ තෑගි භෝග
(3)වාද භේද,ගරු නම්බු,හුරු පුරුදු
(4)කන කර,ඉන ඉහ,කෙළ තොළු

19. **රකාරාංශය රේඵය,යංශය,අනුස්වාරය** ඒ අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1)වික්‍රමය, මාර්ගය, සාමර්ථ්‍යය, සංඛ්‍යාව
(2)සාමර්ථ්‍යය, සංඛ්‍යාව, වික්‍රමය, මාර්ගය
(3)මාර්ගය, සාමර්ථ්‍යය, සංඛ්‍යාව, වික්‍රමය
(4)සංඛ්‍යාව, මාර්ගය, සාමර්ථ්‍යය, වික්‍රමය

20. මුලින් යෙදී ඇති පදයේ අර්ථයට **සමාන අර්ථයක් නොදෙන** පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) සාගරය - සින්ධු/අර්ණවය/සයුර
(2) දිය - උදක/අඹ/පැන්
(3) ප්‍රකට - පුවතර/පතල/ප්‍රසිද්ධ
(4) ගෘහය - නිවස/ආලය/ගෙය

21. මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථය දෙන පදය ද ඇතුළත් පද පේළිය තෝරන්න.
(1)කාලය - සමය/අන්තරය/විරාමය
(2)විනෝදය - විවේකය/විශ්‍රාමය/විරමනය
(3)උත්සහය - උදාසීනත්වය/උන්නතිය/ප්‍රශංසාව
(4)සමස්ත - සියලු/සකල/සර්ව

22.පහත සඳහන් නාමපදවල **නාම ප්‍රකෘති නිවැරදිව** දැක්වෙන වරණය තෝරන්න.
**සිංහයා, මහල්ලා, අත්ත, යතුර**
(1)සිංහ/මහලු/අත්ත/යතුර
(2)සිංහ/මහලු/අතු/යතුරු
(3)සිංහයා/මහල්ලෝ/අත්ත/යතුර
(4)සිංහයා/මහල්ලෝ/අතු/යතුරු

23. පහත සඳහන් ක්‍රියාපද සෑදීමට යොදා ගෙන ඇති **ධාතු ප්‍රකෘති නිවැරදිව** යෙදී ඇති වරණය තෝරන්න.

**කැපුවේය, රකිති, ලියුහ**

(1)කප/රකි/ලියූ
(2)කප/රකි/ලිය
(3)කැපූ/රකි/ලියූ
(4)කැපු/රකී/ලිය

24.මුලින් දී ඇති **ව්‍යාකරණ** ගණයට අයත් නොවන පදයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1)**නාමපද** - සුවඳ,දහය,සාගරය,නටන
(2)**තද්ධිත** - රූමත්,සිල්වත්,ගුණවත්,ආදර්ශමත්
(3)**නිපාත** - විසින්,සමග,සහ, මෙන්
(4)**උක්තපද** - ඔවුනු,අපි,නුඹ,ජනතාව

අංක 25 සහ 26 ප්‍රශ්නවල එක් එක් **ප්‍රස්තාව පිරුළට** වඩාත් ගැළපෙන අදහස තෝරන්න

25. **හානා හීය පානා අඬහැරෙන් දැනේ.**

(1)කුඹුර කොටන බව උදලු ශබ්දයෙන් දැනේ.
(2)කුඹුරේ වැඩ කෑ ගසා කළ යුතුය.
(3)හානවිට හයියෙන් කෑ ගැසිය යුතුයි.
(4)කරන කටයුත්තේ සාර්ථක අසාර්ථක බව උත්සහයෙන් දැනේ.

26.**බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ.**

(1)යමක් භාරගත් විට එය අවසන් කළ යුතුයි.
(2)නටන්නා බෙරේ ගහන්නම ඕනෑ.
(3)බෙරේ ගහන්න බැඳ ගත යුතුයි.
(4)යමක් කරන්න දැනුමක් අවශ්‍ය වේ.

අංක **27** සහ **28** ප්‍රශ්නවල එක් එක් **ප්‍රකාශනයට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම** තෝරන්න.

27. "තමාට නියමිත වැඩය තිබියදී අනුන්ගේ වැඩ කිරීමට යෑම"

(1)අනුන්ගේ පහනෙන් එළිය බැලීම.
(2)අටුව කඩා පුටුව සෑදීම.
(3)අඬුව තියෙද්දී අත පුච්චා ගැනීම.
(4)බල්ලාගේ වැඩය බූරුවා කරන්නා යෑම.

28. අනුවණ අයට හොඳ දේවල් අගය නැත.

(1)කිරෙන් සේදුවත් අඟුරු සුදු නොවේ.
(2)උළු වපුරා මුං බලාපොරොත්තු වීම.
(3)කුඩැල්ලා කොට්ටේ උඩ තිබ්බා වාගේ.
(4)උරුලෑවගේ ගඳ අරින්නට පුළුවන් ද?

අංක **29** සිට **33** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති **වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය** තෝරන්න.

29.(1)මිනිස්සු බොරු කියන්නේ ඇයි?
(2)අප රට සංවර්ධනය කරන්නේ කවදා ද ?
(3)සියලු මිනිස්සු සංවර්ධනයට හවුල් විය යුතු ය.
(4)දරුවෝ දෙමාපියන්ට උවටැන් කරනු වර්.

30. (1)ශිෂ්‍යයෝ විභාගයට පාඩම් කර නැත.
(2)අපි සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
(3)පදිකයෝ පාර මාරුවීමට සුදු ඉරු භාවිතා කළ යුතුය.
(4)කසළ ප්‍රශ්නය විසඳීම සඳහා පුරවැසියෝ ඉදිරිපත් වීම මැනවි.

31. (1)පසද්වාල රාජධානිය සන්තක වූ සේනා තොමෝ මෙතකැයි පමණ නැත්තීය.
(2)බ්‍රහ්මදත්ත රජ තෙමේ එක් සියයක් රාජධානියේ සියලු සේනාව හා සමග ආවෝය.
(3)ඉන් එක් කෙනෙක් වැන්ද වූ හම් වැඳි පක්ෂයේ රජහට පරාජය වන්නාහ.
(4)ඒ අසා රජදරුවෝ තාක් මුළුල්ල වඩ වඩා භයපත් වැ පලා යන්නේය.

32. (1)සියලු ජයග්‍රාහකයන් ආනන්ද නිවාසයේ ශිෂ්‍යයෝ නො වූහ.
(2)රියදුරෝ මාර්ග නීති අනුගමනය කළ යුතු ය.
(3)මවුතොමෝ ආදරයෙන් දරුවන් බලා ගත්තාය.
(4)ඔවුන් තුමු වෙසක් කලාපය නැරඹුවේය.

33. (1)කම්කරුවෝ පස් දෙනෙක් පාලම තැනීමට පැමිණියහ.
(2)කම්කරුවන් පස් දෙනෙක් පාලම තැනීමට පැමිණියහ.
(3)කම්කරුවෝ පස් දෙනෙකු පාලම තැනීමට පැමිණියහ.
(4)කම්කරුවෝ පස් දෙනෙක් පාලම තැනීමට පැමිණියේය.

අංක 34 සහ 35 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ **පද බෙදා ලිවීම** අතින් **වඩාත් නිවැරදි** වාක්‍ය තෝරන්න.

34. (1)මධ්‍ය විද්‍යාලවලට පිවිස ඉගෙනුම ලැබූ දරුවෝ විශ්ව විද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය ලැබීමේ අයිතියේ උපරිම ඵල භුක්ති වින්දෝ ය.
(2)ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ පරමාභිලාෂයෙන් ඔවුන් පෙළඹ වීම සඳහා උන්වහන්සේ කළ නිර්මාණ බොහෝය.
(3)අභිමානයෙන් යුතුව මේ මව්බිම අනාගත දැයට රැකදීම අපගේ පරම යුතු කමකි.
(4)විශේෂාංග ලිපියක් එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සෑමපාර්ශ්වයක්ම අවධාරණය කරමින් සම්පාදනය කරනලද්දක් විය යුතුය.

35. (1)ටී.බී ජායා මහතා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ සේවයකිරීමෙන් අනතුරුව මොරටුවේ වේල්ස්කුමර විද්‍යාලයේ ගුරුමණ්ඩලයට ඇතුළත් වුයේය.
(2)ඒ සා විශාල දුර කතරක සිට දුවඑද්දී දැනුණු තනි කම කොතෙක් හැඩුවද සිතින් බැහැර නොයන බව පසුව ඊයෝහෙයිට වැටහුණේ ය.
(3)චුල්ල ධනුද්ධර ජාතකයේ සඳහන් වන ඇතැම් කොටස් නාට්‍ය පෙළ රචනයේ දී ඉවත් කර ඇත.
(4)දෙමාපියන්ගේ අවවාදයෙන්ද අසංගයන්ගේ මැදහත්කමෙන්ද පරිපීඩිතවූ සිත් ඇති නීලමණීකුමරි දිනක් සවස උයනේ සක්මන්කළාය.

පහත කවිය ඇසුරින් 36 - 38 ප්‍රශ්න සඳහා වඩාත් යෝග්‍ය වරණය තෝරන්න.

තුරු යටියෙන් හුණු පැටි ලෙහෙනුන් රැගෙන
සිතු අටියෙන් සිඹ ඇඟ පිරිමැද සෙමෙන
මල ගෙටියෙන් පැන් පොවමින් අතිනතින
සිටි පැටියෙන් හෙරණුන්ගෙන් වෙයි සොබන

36. මේ කවියෙන් කියැවෙන්නේ.
(1)මාලිගාවක උයනක් ගැනයි
(2)වනරොදක් ගැනයි.
(3)තුරු වදුලක් ගැනයි.
(4)විහාර භූමියක් ගැනයි.

37.මෙහි සඳහන් අයගේ සත්ව කරුණාව වන්නේ
(1)ලේන් පැටව් ඇති කිරීමයි.
(2)වනයට ගොස් ලේන් පැටව් මුදා හැරීමයි.
(3)ගස්යට වැටුණු ලේන් පැටවුන් අරගෙන පැන් පෙවීමයි.
(4)මල් ගොටුවලට ලේන් පැටවුන්ට කෑම දීමයි.

38.සිටි පැටියෙන් යන්නෙන් හැඟවෙන්නේ.
(1)පාට ඇඳුමින් සැරසී සිටි බවයි.
(2)බාල වියේ සිටි යන්නයි.
(3)සිටිය ආකාරය ගැනයි.
(4)පැටව් සිටි බවයි.

අංක 39 - 40 ප්‍රශ්න සඳහා පහත කවිය උපයෝගි කර ගන්න.

වාන් කෙතේ අස්වනු අඩුවා සැබව
හින් කුඩු ගසා සොරු ගත්තා සැබව
ඒත් තරහ නැත වී කුරුලනි අසව
රූන් සරින් මගෙ හිත යයි තෙපි කැටුව

39.කුරුල්ලන් සමග තරහ නොවන්නේ කවුරුන්ද?
(1) වැද්දකු (2) ගොවියෙකු (3) දඩයම්කරුවකු (4) සොරෙකු

40.මෙහි සඳහන් සොරුන් විය හැක්කේ කවුරුන්ද?
(1) ගොවියෝ (2) වී කුරුල්ලෝ (3) කුරුල්ලෝ (4) ගමේ කොල්ලෝ